ඇමුණුම 01

අමෙරිකා එක්සත් ජනපදයේ සහශ්‍රක අභියෝගතා සමායතනය
සමඟ අත්සන් කිරීමට සකස් කරනු ලැබ තිබෙන සංයුක්ත ගිවිසුම කෙටුම්පත,
යෝජිත ව්‍යාපෘති හා ඒවා ක්‍රියාත්මක කිරීමට සකසනු ලැබ ඇති ක්‍රමවේදය
සමාලෝචනය කිරීමේ කමිටුව

# ආරම්භක වාර්තාව

2020 පෙබරවාරි 14

සහශ්‍රක අභියෝගතා සමායතන යෝජනාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව
අග්‍රාමාත්‍ය කාර්යාලය
මල් පාර
කොළඹ 07.

# ඉදිරිපත් කිරීම හා සංක්ෂේපය

අමෙරිකා එක්සත් ජනපදයේ සහශ්‍රක අභියෝගතා සමායතනය (MCC) සමඟ අත්සන් කිරීමට සකස් කරනු ලැබ තිබෙන ගිවිසුම් හා අදාළ ව්‍යාපෘති පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2020 ජනවාරි 1 දිනැති ව පත් කරන ලද විශේෂ කමිටුවේ ආරම්භක වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමු.

සහශ්‍රක අභියෝගතා (MCC) ප්‍රදානය, ඒ හා බැඳි සංයුක්ත ගිවිසුම (Compact), වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (PIA) හා ඒ උදෙසා ස්ථාපනය කිරීමට යෝජිත සමාගමේ (MCA-Sri Lanka) සාංගමික ව්‍යවස්ථාව කමිටුවේ ගැඹුරු අධ්‍යයනයට යොමු කෙරිණි. ඊට අමතර ව, කමිටුවේ අවධානයට යොමු කෙරුණු ලිපි ලේඛන පරිශීලනයෙන් හා අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කිරීම තුළින් යෝජනාවලිය ගොඩනැඟීම උදෙසා යොදාගෙන තිබෙන ක්‍රියාවලිය හා යෝජිත ව්‍යාපෘති පිළිබඳව විමර්ශනය කිරීමට ද පියවර ගැනිණි.

මේ පිළිබඳව තව දුරටත් අධ්‍යයනයන් සිදු කෙරෙමින් පවතින අතරතුර කමිටුවට පැවරී ඇති කාර්යභාර ලේඛනයේ සඳහන් පරිදි මෙතෙක් කමිටුව විසින් කරන ලද විශ්ලේෂණාත්මක නිරීක්ෂණයන් හා නිගමනයන් සංක්ෂේපණය කරමින් මෙම ආරම්භක වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත මෙ සේ ඉදිරිපත් කරමු.

ප්‍රාග්ධන සම්පත් හිඟ සහ ණය බරින් පෙරපුණු ශ්‍රී ලංකාවේ මූලික ආර්ථික සංරෝධක දුරලීමේ ආයෝජන උදෙසා අවශ්‍ය මූල්‍ය සම්පත් රටේ විදේශ ණය බර වැඩි නොකරමින් සපයා ගැනීමේ හැකියාව MCC යෝජනාව තුළ ඇති නමුදු, (අ) සහශ්‍රක අභියෝගතා ප්‍රදානය යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතීන් අතර ශ්‍රී ලංකාවේ ජාතික, සමාජ හා ආර්ථික සුභසිද්ධියට අගතිකාරී බලපෑම් එල්ලවිය හැකි යම් අංග ඇතුළත් වී ඇති බව ද, (ආ) සංයුක්ත ගිවිසුමෙහි, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමෙහි මෙන්ම ඒ උදෙසා ස්ථාපනය කිරීමට යෝජිත සමාගමේ සාංගමික ව්‍යවස්ථා කෙටුම්පතෙහි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා දේශයේ නීති පද්ධතියට අනුකූල නොවීමට ඉඩ ඇති වගන්ති හා ප්‍රතිපාදන මෙන් ම ජාතික අරමුණුවලට, ස්වෛරීත්වයට හා ජාතික ආරක්ෂාවට අගතිකාරී ලෙස බල පෑ හැකි වෙනත් කොන්දේසි ද ඇතුළත් වී ඇති බව ද, (ඇ) මෙම යෝජනාවලිය ගොඩනැඟීම උදෙසා ශ්‍රී ලංකා රජයේ ස්ථාපිත ආයතනික ව්‍යුහය තුළ ප්‍රමාණවත් විනිවිද පෙනෙන සුළු හා සහභාගිත්ව ක්‍රියාවලියක් අනුගමනය වී නොමැති බව ද, කමිටුව නිරීක්ෂණය කරයි.

ඉහත (අ) හි දැක්වෙන අවදනම් සහිත ව්‍යාපෘති අංග සහ (ආ) යටතේ ගැණෙන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන්, ආයතනික ව්‍යුහයන් සහ ඒ උදෙසා කෙටුම්පත් කර ඇති ගිවිසුම්වල කොන්දේසි හා අන්තර්ගත නීතිමය රාමු සම්බන්ධව සුදුසු නිවැරදි කිරීම්, සංශෝධනයන් හා ඉවත් කිරීම්වලින් තොර ව මෙම ගිවිසුම් අත්සන් නො කළ යුතු බව කමිටුවේ මූලික නිර්දේශය යි. එ වැනි අවශ්‍ය සංශෝධනවලින් පසුව, ගිවිසුම් කොන්දේසි හා ව්‍යාපෘති යෝජනා පිළිබඳ විනිවිද පෙනෙන සුළු ක්‍රමවේදයක් හරහා මහජන අදහස් ලබා ගැනීමෙන් පසු පාර්ලිමේන්තුවට සභාගත කර අනුමැතිය ලදහොත් පමණක් ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගැනීම සුදුසු බව ද කමිටුව නිර්දේශ කරයි.

| | | | |
|---|---|---|---|
| ලලිතසිරි ගුණරුවන් (සභාපති) | ඩී.එස්. ජයවීර (සාමාජික) | නිහාල් ජයවර්ධන (සාමාජික) | නාලක ජයවීර (සාමාජික) |

## 1. ප්‍රවේශය

අමෙරිකා එක්සත් ජනපදයේ සහශ්‍රක අභියෝගතා සංස්ථාවේ (Millennium Challenge Corporation or MCC) ප්‍රතිදාන යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන සහ ඒ වෙනුවෙන් අත්සන් කිරීමට සකස් කරනු ලැබ තිබෙන ගිවිසුම් නැවත සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස විශේෂ කමිටුවක් පත් කිරීමට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අංක PMO/CM/64/2019 දරණ පත්‍රිකාවට 2019 දෙසැම්බර් 18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය හිමි විය (ඇමුණුම -1). එම තීරණයට අනුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුව අංක PMO/2/2/2/Rev.MCC සහ 2020 ජනවාරි 01 දාතම සහිත ලිපිවලින් පත් කරනු ලැබ ඇත:

මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් (කමිටු සභාපති)
හිටපු ප්‍රවාහන ලේකම් ඩී එස් ජයවීර
ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන
වරලත් වාස්තු විද්‍යාඥ නාලක ජයවීර

එම පත්වීමට අදාළ කාර්යභාර විස්තරයේ (ඇමුණුම-2) නියම කරනු ලැබ ඇති පරිදි කමිටුවේ ආරම්භක වාර්තාව මෙහි ලා ඉදිරිපත් කෙරේ.

## 2. පසුබිම

සහශ්‍රක අභියෝගතා සමායතනය (MCC) යනු ඌණ සංවර්ධිත රටවල දිළිඳු කම පිටු දැකීම හා ආර්ථික වෘද්ධිය ඉදිරියේ ඇති සංරෝධක (Constraints) ඉවත් කිරීම උදෙසා අමෙරිකා එක්සත් ජනපදයේ මූල්‍යාධාර පිරිනැමීම වෙනුවෙන් අමෙරිකා එක්සත් ජනපද කොංග්‍රසයේ 2003 සහශ්‍රක අභියෝගතා පනතින් (Millennium Challenge Act of 2003) ස්ථාපිත ආයතනයකි. එහි ආධාර පිරිනැමීම් ලැබීම උදෙසා අදාළ ප්‍රතිග්‍රාහක රටවල් පූර්වයෙන් තීරණය කෙරෙන යම් ඒක-පුද්ගල ආදායම් සීමාවකට අඩු ආදායම් සහිත විය යුතු අතර MCC හි ප්‍රදාන ලැබීමේ සුදුසුකම් ද සපුරා තිබිය යුතු ය.

MCC ප්‍රදාන ලබා ගැනීම උදෙසා ශ්‍රී ලංකාව අපේක්ෂකත්වයට සුදුසු බව 2004 පෙබරවාරි 26 දිනැති ලිපියෙන් MCC ආයතනය විසින් ශ්‍රී ලංකාවේ විදේශ ලේකම් වෙත දන්වනු ලැබ ඇත. එ සේ ම, 2005 දෙසැම්බර් 8 දින සහ 2006 දෙසැම්බර් 7 දින ලිපි මඟින් ද මේ බව MCC ආයතනය විසින් ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත නැවත ද දන්වනු ලැබ තිබේ. එහෙත්, 2015 වන තෙක් ශ්‍රී ලංකා රජය විසින් මේ පිළිබඳව කිසිදු ඉදිරි පියවරක් ගෙන ඇති බවක් නිරීක්ෂණය නො වේ. 2015 නව රජය බලයට පැමිණීමෙන් පසු ශ්‍රී ලංකා රජය විසින් පළමුකොට MCC පර්යන්ත පහසුකමක් (Threshold Facility) සඳහා ද, ඉන් අනතුරුව MCC සංයුක්තයක් (MCC Compact) සඳහා ද MCC සමඟ සාකච්ඡා කර ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති ඒකකය සහ MCC ආයතනය, අමෙරිකාවේ හාවඩ් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රයේ (Harvard University's Centre for International Development or HUCID) ද සහය ඇතිව සංරෝධක ඇගැයීමක් (Constraint Analysis) සිදු කර ඇත. කමිටුවට වාර්තා වී

ඇති පරිදි එම අධ්‍යයනයේ දී පහත සඳහන් ප්‍රධාන සංරෝධක හඳුනා ගනු ලැබ ඇති බව නිරීක්ෂණය වෙයි :

(අ) ඉඩම් පරිපාලනය පිළිබඳ සංරෝධක
(ආ) ප්‍රවාහනය පිළිබඳ සංරෝධක
(ඇ) ඒ අංශ හා අදාළ ප්‍රතිපත්ති සංරෝධක

ඒ හා අදාළ ව, ශ්‍රී ලංකා රජය විසින් සංරෝධක දුරු කිරීමේ ක්‍රියාවලින්ගෙන් සමන්විත පහතින් දැක්වෙන ව්‍යාපෘති යෝජනා හයක් MCC වෙත ඉදිරිපත් කරනු ලැබ තිබේ (අංක PMO/NC/09/2018 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ මේ බැව් සඳහන් වේ):

i. ඉඩම් පරිපාලන පද්ධතිය
ii. ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය
iii. කෘෂිකාර්මික සැපයුම් ක්ෂේත්‍රයේ වර්ධනය
iv. පැලියගොඩ සිට මාලඹේ දක්වා අහස් අධිවේගී මාර්ගය
v. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ සංවර්ධනය
vi. උසස් තාක්ෂණ විශ්වවිද්‍යාලයක් ස්ථාපනය කිරීම

එම යෝජනා අතරින් ඉඩම් පරිපාලන පද්ධතිය ප්‍රතිසංස්කරණය (ඇ.ඩොලර් මිලියන 67.3) හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය (ඇ.ඩොලර් මිලියන 350.0) සඳහා වූ යෝජනා අදාළ ව්‍යාපෘති ඇගැයීම් හා අධීක්ෂණය (ඇ.ඩොලර් මිලියන 12.7) සහ වැඩසටහන් පරිපාලනය (ඇ.ඩොලර් මිලියන 50.0) ද සහිතව සමස්තයක් ලෙස ඇ.ඩොලර් මිලියන 480 ක MCC ප්‍රදාන යෙදවීම මඟින් ක්‍රියාවට නැංවීමට තෝරා ගනු ලැබ තිබේ (සංයුක්ත ගිවිසුමේ ඇමුණුම්-II). මෙම වැඩසටහන ගොඩනැඟීම වෙනුවෙන් ඇ.ඩොලර් මිලියන 10 ක සමස්ත ප්‍රදානයක් සඳහා 2017 ජූලි 26 සහ 2018 ජූනි 18 දින සහිත මූලික ගිවිසුම් දෙකකට මේ වන විට ද ශ්‍රී ලංකා රජය MCC ආයතනය සමඟ අත්සන් කර ඇත.

මෙම ව්‍යාපෘති යෝජනාවලට මෙන් ම MCC සංයුක්ත ගිවිසුමට පසුගිය කාලයේ රට තුළ පැන නැඟුණු විරෝධය නිසා එම ගිවිසුම් අත්සන් කිරීමට පසුගිය 2019 ඔක්තෝබර් 29 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබාගෙන තිබූ අනුමැතිය අත්හිටුවා මෙම කමිටුව පත්කර අදාළ ගිවිසුම, ව්‍යාපෘති හා ඒ හා අදාළ වෙනත් කරුණු නැවත සමාලෝචනය කර රජයට නිර්දේශ ලබාගැනීමට ඉහතින් ද සඳහන් කෙරුණු පරිදි 2019 දෙසැම්බර් 18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කරනු ලැබ ඇත.

3. කමිටුවේ අධ්‍යයන ක්‍රමවේදය

2020 ජනවාරි 1 දින පටන් ක්‍රියාත්මක කෙරෙන ලෙස පත් කර ඇති මෙම කමිටුවේ අධ්‍යයනයන් පහත දැක්වෙන පරිදි සිදු කෙරෙමින් පවතී :

(අ) කමිටුව වෙත රජය විසින් ලබා දෙන ලද්දා වූ හා 2019 ඔක්තෝබර් 29 දින අමාත්‍ය මණ්ඩලය විසින් අත්සන් කිරීමට අනුමැතිය ලබා දුන්නා වූ MCC සංයුක්ත ගිවිසුම (Compact), ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (Program Implementation Agreement or PIA), ක්‍රියාන්විතය මෙහෙයවීම උදෙසා ස්ථාපනය කිරීමට යෝජිත MCA-Sri Lanka නමැති ඇපයෙන් සීමිත සමාගමේ (a Company

limited by Guarantee) සාංගමික ව්‍යවස්ථාවලි කෙටුම්පත (Articles of Association) හා මෙම යෝජනාවලියට අදාළව සපයා ගත හැකි වූ වෙනත් ලේඛන / වාර්තා ද අධ්‍යයනය කිරීම

(ආ) ශ්‍රී ලංකාව වෙනුවෙන් සංයුක්තය ගොඩනැඟීමේ කණ්ඩායමේ (Compact Development Team or CDT) නිලධාරීන් සමඟ සහ මෙම ගිවිසුම ගොඩනැඟීමට, ඊට අදාළ සංරෝධක අධ්‍යයනයට හා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් MCC ආයතනය සමඟ ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීමට දායක වූ රජයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම

(ඇ) MCC ආයතනයේ ශ්‍රී ලංකාවේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කිරීම

(ඇ) රට තුළ ක්‍රියාත්මක විවිධ වෘත්තික කණ්ඩායම් හා අවබෝධාත්මක පුරවැසියන් වෙතින් අදහස් - උදහස් ලබා ගැනීම

(ඉ) MCC ගිවිසුම සම්බන්ධයෙන් අන්තර්ජාලය - සම්මන්ත්‍රණ වැනි විවිධ ප්‍රභවයන් ඔස්සේ තොරතුරු සපයා ගැනීම හා ඒවා විමැසීමට ලක් කිරීම

(ඊ) MCC සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් ලබා ගත හැකි තොරතුරු සපයාගෙන අධ්‍යයනය කිරීම

(උ) රජයේ අදාළ ආයතන සමඟ විටින් විට තොරතුරු හුවමාරු කර ගැනීම

මේ වන විට කමිටුව විසින් ඇමුණුම-3 හි දැක්වෙන ආයතන - නිලධාරීන් - අයවලුන් සමඟ අදාළ ප්‍රස්තුතය පිළිබඳ සාකච්ඡා කර ඇති අතර ඉදිරියට ද එම සාකච්ඡා හා අධ්‍යයනයන් සිදු කිරීමට අපේක්ෂිත ය. ඉහත (ඇ) හි දැක්වෙන පියවර සඳහා මේ වන විට මාධ්‍ය නිවේදනයක් අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් නිකුත් කරනු ලැබ ඇති අතර පෙබරවාරි 15 වැනි දා තෙක් ඒ උදෙසා කල් ලබා දී ඇත. එ සේ ම, අතිගරු ජනාධිපතිතුමා වෙත මූලික සටහනක් ජනාධිපති ලේකම්තුමා ගේ ඉල්ලීම පරිදි 2020 ජනවාරි 13 වැනි දිනැති ලිපියෙන් (ඇමුණුම-4) ලබා දී ඇත. තව ද, 2019 දෙසැම්බර් 30 වැනි දින ගරු අගමැතිතුමා, අග්‍රාමාත්‍ය ලේකම්තුමා ඇතුළු පිරිස සමඟ කරන ලද ආරම්භක සාකච්ඡාවට අමතරව 2020 ජනවාරි 24 වැනි දින අග්‍රාමාත්‍ය ලේකම්තුමා ගේ මූලිකත්වයෙන් ගරු නීතිපතිතුමා ගේ නියෝජිතවරියක සමඟ ද අදහස් හුවමාරු කරගැනීමට කටයුතු කර තිබේ. එ සේම, වැඩිමනත් නිරීක්ෂණ හා නිර්දේශ ගරු නීතිපතිතුමා වෙතින් ලබාගැනීමට අග්‍රාමාත්‍ය ලේකම්තුමා මඟින් යොමු කෙරිණි (ඇමුණුම-5). 2020 ජනවාරි 29 දින ජනාධිපති ලේකම්තුමා සමඟ ද කමිටු සාමාජිකයන් ගේ සාකච්ඡාවක් පවත්වන ලදී.

## 4. මූලික නිරීක්ෂණ හා අන්වේෂණ

MCC පහසුකම සංවර්ධන ආධාරයකි. ආපසු ගෙවිය යුතු ණයක් නො වේ. එ බැවින්, ප්‍රාග්ධන සම්පත් හිඟ කමින් සහ විදේශ ණය බරින් පෙරපුණු ආර්ථිකයක් සහිත ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය උදෙසා කඩිනමින් ඉවත් කළ යුතු බවට විධිමත් ව හඳුනා ගැනෙන ප්‍රබල සංරෝධක ඇත් නම් ඒවා රටේ විදේශ ණය බර තව දුරටත් වැඩි නොකරමින් දුරලීම සඳහා අදාළ ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් සහශ්‍රක අභියෝගතා සංයුක්තය (MCC Compact) තුළින් සපයා ගැනීමේ හැකියාව ඇත. විශේෂයෙන්, එ සේ අත්‍යවශ්‍ය යැ යි තීරණය කෙරෙන ආයෝජනයන් නො කර සිටිය නො හැකි බැවින්, ඒවාට

අවශ්‍ය මූල්‍ය සම්පත් රටේ ආර්ථිකය තුළින් ම සම්පාදනය කිරීමට නො හැකි නම් ඒ උදෙසා විටෙක ප්‍රසම්පාදන නිදහස පවා සීමා කෙරෙන කොන්දේසි ද සහිත ද්විපාර්ශ්වික විදේශ ණය ක්‍රම ද ඇතුළත් විවිධ ප්‍රභවයන් වෙතින් පොළී මත විදේශ ණය ගැනීම කරා තල්ලු වීමට වඩා ආපසු ගෙවීමක් හෝ නොමැති සෘජු ප්‍රදානයක් වන MCC සංයුක්තය සාපේක්ෂ වශයෙන් වාසිදායක සහ තාර්කික විකල්පයක් බව විශේෂයෙන් සඳහන් කළ යුතු නැත.

එ සේ නමුදු, යෝජිත සහශ්‍රක අභියෝගතා සංයුක්ත (MCC Compact) යෝජනාවලිය එ වැනි සරල මූල්‍යමය රාමුවක් තුළ පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නො වන බවත්, ඒ තුළ අන්තර්ගත සංකීර්ණ නෛතික බැඳීම් හා කොන්දේසි අනුව එම යෝජනාවලියෙන් ගම්‍ය විය හැකි පුළුල් පරාසයක සමාජ-ආර්ථික හා භූ-දේශපාලනික බලපෑම් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය බවත් කමිටුවේ මූලික නිරීක්ෂණයයි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ දේශපාලන-ආර්ථික ස්වෛරීත්වය වෙනත් කිසිදු අවශ්‍යතාවක් හමුවේ කැප කළ නො හැකි බවට වන අවිවාදාත්මක නිර්ණයකය සිය විමැසුම් රාමුව ලෙස යොදාගනිමින් කමිටුව විසින් මේ සම්බන්ධයෙන් මෙ තෙක් කරන ලද අධ්‍යයනයන් තුළින් එළැඹි මූලික නිරීක්ෂණයන් පහත දැක්වෙන පරිදි අංශ හතරක් ඔස්සේ ඉදිරිපත් කෙරේ:

- MCC යෝජනාවලියට අදාළ ගිවිසුම් කොන්දේසි සම්බන්ධ නිරීක්ෂණ
- MCC යෝජනාවලියට ඇතුළත් වී ඇති ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ
- MCC යෝජනාවලිය ගොඩනැගීම් ක්‍රමවේදය පිළිබඳ නිරීක්ෂණ
- MCC ප්‍රදාන පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම්

## 4.1 MCC යෝජනාවලියට අදාළ ගිවිසුම් කොන්දේසි සම්බන්ධ නිරීක්ෂණ

i. මෙම යෝජනාවලියට අදාළ ගිවිසුම් අත්සන් කළහොත් ඒ අනුව ප්‍රදාන ලැබීම, ඒ සඳහා වූ MCC සංයුක්ත ගිවිසුම (Compact), ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (Program Implementation Agreement or PIA), හා ක්‍රියාත්විතය මෙහෙයවීම උදෙසා ස්ථාපනය කිරීමට යෝජිත MCA-Sri Lanka නමැති ඇපයෙන් සීමිත සමාගමේ (Company limited by Guarantee) සාංගමික ව්‍යවස්ථාවලි කෙටුම්පත (Articles of Association) අනුව සිදු වනු ඇත. මේ සංයුක්ත ගිවිසුම ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් නීතිගත කළ යුතු බව මෙහි සඳහන් පූර්ව කොන්දේසියකි.

ii. ඒ අනුව, මෙම ආධාර ක්‍රමය හා වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ මෙතෙක් ශ්‍රී ලංකාවේ පිළිගත් සාමාන්‍ය ද්විපාර්ශ්වික ණය හෝ ආධාර යෝජනාක්‍රම ක්‍රියාත්මක කෙරුණු පරිදි භාණ්ඩාගාරය ඇතුළු ශ්‍රී ලංකා රජයේ ස්ථාපිත ආයතනික ව්‍යුහය තුළින් නොව, ශ්‍රී ලංකා රජය විසින් විශේෂ ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් ලෙස ස්ථාපනය කරනු ලැබිය යුතු ඇපයෙන් සීමිත සමාගමක් (Company limited by Guarantee) ඔස්සේ ය. MCA-Sri Lanka ලෙස නාම කිරීමට යෝජිත එම සමාගම ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්ගෙන් සමන්විත අධ්‍යක්ෂක මණ්ඩලයකින් පාලනය වනු ඇති නමුදු එහි කටයුතුවලට එම අධ්‍යක්ෂ මණ්ඩලයට හැර ශ්‍රී ලංකා රජයේ වෙනත් කිසිදු නිලධාරියකුට හෝ ආයතනයකට මැදිහත්විය නො හැකි අයුරු PIA හි 1.3(b)(iv) මඟින් ප්‍රකාශිතව ම නීතිමය ප්‍රතිපාදන සකසනු ලැබ ඇත.

iii. ඒ සේ වුව ද, එම සමාගමේ සේවකයන් සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් පත්කර ගැනීමේ පටන් මුදල් ගෙවීම හෝ අත්හිටුවීම හා ප්‍රගති සමාලෝචනය දක්වා සමාගමේ ක්‍රියාත්මකත්වයේ සියලු කටයුතු හා පියවරයන් සඳහා මැදිහත්වීමට MCC ආයතනයට හැකි වන පරිදි MCC සංයුක්ත ගිවිසුම (Compact) තුළ සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (PIA) තුළ වගන්ති (විශේෂ වශයෙන් 1.2, 1.3, 2.1, 2.2, 2.4, 2.8, 2.9, 2.10, 3.1, 3.2, 3.3, 5.3) ඇතුළත් කර ඇත. සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ ඡන්ද බලය අහිමි සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකාවේ MCC නියෝජිත නම් කරනු ලැබ තිබීම (MCA-Sri Lanka සංස්ථාපන කෙටුම්පතෙහි 12(b)(ii) වගන්තිය) ද කමිටුවේ අවධානයට ලක් වෙයි. ඒ අනුව නිරීක්ෂණය වන්නේ MCA-Sri Lanka සමාගම ශ්‍රී ලංකා රජයේ පාලනයෙන් බැහැර කරනු ලැබ තිබෙන නමුදු MCC ආයතනයේ බලපෑමෙන් ස්වාධීන කරනු ලැබ නැති බවයි. ඒ බැවින්, MCA-Sri Lanka සමාගම ස්වාධීන ඒකකයක් ලෙස සැලකිය නො හැකි බව කමිටුවේ මතයයි.

iv. මෙ වැනි මැදිහත්වීමක් යම් ප්‍රතිලාභී ආයතනයක් මත සිදු කිරීම ප්‍රදානය ලබා දෙන ආයතනයක් විසින් කළ හැකි වනු ඇතැයි අදහස් ඉදිරිපත් විය හැකි නමුදු මෙම ප්‍රදානයේ මූලික පදනම වී ඇත්තේ ශ්‍රී ලංකාව තුළ යහපාලනයක්, නිසි කළමනාකාරිත්වයක් සහ නීතියේ ආධිපත්‍යය යථා පරිදි ක්‍රියාත්මක වීමක් ඇති වග MCC ආයතනය විසින් පිළිගනු ලැබීම බව මෙහි දී අවධානයට ලක් විය යුතු ය. එ වැනි පිළිගැනීමක් සුනිතව තිබියදී, ශ්‍රී ලංකාවේ පිළිගත් සාමාන්‍ය ද්විපාර්ශ්වික විදේශ ආධාර ගිවිසුම් හා ව්‍යාපෘති ක්‍රියාවට නැංවෙන ක්‍රමවේදයෙන් වෙනස් ආකාරයකට MCA-Sri Lanka සමාගමක් ඇති කර ඒ හරහා යෝජිත සංවර්ධන ආයෝජන ක්‍රියාත්මක විය යුතු යැයි කොන්දේසි පැනවීම පරස්පර විරෝධී වෙයි.

v. තව ද, එ වැනි සමාගමක් ස්ථාපනය කළ ද, එය යහපාලනය, නීතියේ ආධිපත්‍යය, හා කළමනාකාරිත්ව කාර්යක්ෂමතාව සහිත රජයකට අයත් සමාගමක් බව MCC ආයතනය ම පිළිගන්නේ නම්, එම සමාගමේ කටයුතු වලට මැදිහත් වෙමින් මාර්ගෝපදේශ දීමට, නිර්දේශ සැපයීමට හෝ අනුමැති ලබා දීමට හෝ MCC ආයතනය මෙම සංයුක්ත ගිවිසුම තුළින් පියවර ගෙන තිබීම ද නො ගැළපෙයි. තව ද, එ සේ මැදිහත් වීමේ බලතල තිබුණ ද, සමාගමේ කටයුතු නිසා සිදු විය හැකි කිසියම් ගැටලුවකදී නෛතික පියවර ගැනෙන්නේ නම් ඉන් MCC ආයතනය නිදහස් කිරීමට ද ප්‍රතිපාදන (සංයුක්ත ගිවිසුමෙහි 6.8 වගන්තිය) සලසනු ලැබ තිබේ. මේ ප්‍රතිපාදන ශ්‍රී ලංකාවට පිළිගත නො හැකි බව කමිටුවේ මතයයි.

vi. සමාගමේ කළමනාකරණ කටයුතුවලට මැදිහත්වීමට රජයට හෝ රජයේ ආයතනවලට නො හැකි පරිදි ප්‍රතිපාදන සැකසුව ද, සමාගමෙන් අපේක්ෂිත නිමැවුම් නිසි පරිදි ලබා දීමේ වගකීම සංයුක්ත ගිවිසුමෙහි 3.2(a) වගන්තියෙන් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රකාශිතව ම පවරනු ලැබ ඇත. තව ද, සමාගම සම්බන්ධ කිසියම් නෛතික පියවරක දී ඒ සියලු වගකීම්වලට ශ්‍රී ලංකා රජය යටත් කිරීමට ද, ප්‍රතිපාදන සලසනු ලැබ තිබේ. මැදිහත්වීමේ බලතල නොමැති රජය මත අදාළ ක්‍රියාවලියක කිසියම් වගකීමක් පැවරීම කළමනාකරණ ප්‍රථම මූලධර්මවලට පවා පටහැණි ය.

vii. තව ද, මෙම යෝජිත ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා රජය MCA-Sri Lanka සමාගම වෙනුවෙන් ගෙවීම කිරීමට පවා ඒ අනුව වක්‍ර මාර්ගයෙන් බැඳී සිටින බව පෙනේ. මෙම තත්වය වඩාත් බැරෑරුම් වන්නේ PIA හි 5.7(a) වගන්තිය ප්‍රකාර ඕනෑම අවස්ථාවක හෝ PIA හි 5.7(b) වගන්තියට අනුව මසක කල් දීමෙන් පසු හෝ ගිවිසුමෙන් ඉවත්වීමට MCC ආයතනයට අවසර ලබා දී ඇති නිසා ය. එ සේ ඉවත් වන විටෙක MCA-Sri Lanka විසින් යොදවාගනු ලැබ තිබෙන සියලු සේවා සැපයුම්කරුවන්ට ගෙවීමට හෝ ඊට අදාළ නෛතික තත්වයන්ට (සමහර විට ගිවිසුමේ ප්‍රකාශිත ව අදාළ කර ඇති, එහෙත් විශ්ලේෂණය කරනු ලැබ නැති, "ජාත්‍යන්තර නීතිය" යටතේ) මුහුණ දීමට හෝ ශ්‍රී ලංකා රජයට සිදුවීට ඉඩ ඇත. මෙ වැනි තත්වයක් තුළ අතිශය අසීරු අඩියකට ශ්‍රී ලංකා රජය පත් වනු ඇති අතර ඒ තුළ සැලකිය යුතු කේවල්කාරී බලයක් පාවිච්චි කිරීමට MCC ආයතනය පියවර ගැනීමට ඇති ඉඩකඩ බැහැර කළ නො හැක. මැඩගස්කරයට සිය MCC ගිවිසුමෙන් ඉවත්වීමට නොහැකි වී ඇත්තේ මෙවැනි තත්වයක් නිසා දැයි ඉදිරියේ දී සොයා බැලීමට කමිටුව අපේක්ෂා කරයි.

viii. එ සේ ම, යෝජිත ක්‍රමවේදයට අනුව MCC ප්‍රදාන ශ්‍රී ලංකා භාණ්ඩාගාරය හරහා ස්ථාපිත ආයතනික රාමුව තුළ කළමනාකරණය නො වන බැවින් එම මුදල් රජයේ පොදු අරමුදලට බැර නො වනු ඇති අතර ඒ අනුව ඒවායේ වියදම් වීම ද පොදු අරමුදලෙන් කෙරෙන වියදම් ලෙස නො සැලකෙනු ඇත. මෙය පාර්ලිමේන්තුව තුළින් ක්‍රියාත්මක විය යුතු මහජනතාව සතු මූල්‍ය පාලනය පිළිබඳ ස්වාධිපත්‍යය බරපතළ ලෙස සීමා කිරීමකි.

ix. තව ද, මෙම වාර්තාවේ ඇමුණුම-6 ලෙස ඇතුළත් කර ඇති MCC සංයුක්ත ගිවිසුම (Compact) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත කළ යුතු බව (සංයුක්තයේ 7.1 වගන්තියෙන්) ප්‍රකාශිත ව දැක්වෙයි. ඒ අනුව ඊට සම්බන්ධ ගිවිසුම්වල වගන්ති අවම වශයෙන් මෙම යෝජනාවලිය ක්‍රියාවට නැංවීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් පමණක් හෝ ශ්‍රී ලංකාවේ වලංගු නීති බවට ඉබේ ම පත් වෙයි. එම ගිවිසුම්වල වගන්ති (විශේෂයෙන් සංයුක්ත ගිවිසුමේ 2.2, 3.3, 3.5, 3.6(a), 3.8(a), 3.8(b) සහ 5.1(b)(iv) වගන්ති) අතර ඇති බව පෙනෙන ශ්‍රී ලංකාවේ නොවන අණ පනත් - රෙගුලාසි - ක්‍රමවේදවලට (Section 607 of the Millennium Challenge Act of 2003, MCC's Program Procurement Guidelines, Accounting Principles prevailing in the US, MCC's Guidelines for Financial Audits, United States Government Policy, වැනි) නෛතික පිළිගැනීමක් ශ්‍රී ලංකාව තුළ ලැබෙන පරිදි ප්‍රතිපාදන සකසනු ලැබ ඇති බව පෙනේ. මෙය කිසි සේත් සුදුසු තත්වයක් නො වේ.

x. යෝජිත සංයුක්ත ගිවිසුමේ මුල් කෙටුම්පතෙහි එම සංයුක්තය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඉහළින් තිබිය යුතු බවට පනවා තිබූ කොන්දේසිය තුළින් හා ඊට ශ්‍රී ලංකා නියෝජිතයන් ගේ අවධානය යොමු වූ විට ඉහත (vii), (viii) හා (ix) හි විග්‍රහ කෙරුණු ප්‍රතිපාදන ද ඇතුළත් සංයුක්ත ගිවිසුම් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ නීතියක් බවට පත් කිරීම ඔස්සේ එය ශ්‍රී ලංකාව තුළ වලංගු කරවීමට දරනු ලැබ ඇති ප්‍රයත්නය තුළින්

මෙම යෝජිත ක්‍රමවේදයේ අරමුණුවල ඇති සද්භාවය අභියෝගයට ලක්වන බව ද කමිටුවේ අදහසයි.

xi. ඉහත (viii) හා (ix) අනුව කමිටුවේ අවධානයට ලක් වන්නේ මෙම ගිවිසුම ඔස්සේ ශ්‍රී ලංකා නීති පද්ධතියට ආගන්තුක වූ සහ බලපෑම් වපසරිය පිළිබඳ ගැඹුරක් අප සතුව නොමැත්තා වූ ආනයනික නීති රාමුවක කටයුතු කරන ශ්‍රී ලංකා රජයට අයිති ව්‍යවස්ථාපිත ආයතනයක් බිහි වන බවයි. එ සේ වන්නේ නම්, එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තියේ පැහැදිලි කෙරෙන අන්‍යසකරණය කළ නොහැකි ජනතා ස්වෛරීත්වය වක්‍ර මාර්ගයෙන් උල්ලංඝනය කිරීමක් වීමට ඉඩ ඇති බව කමිටුවේ මතයයි. එය නුසුදුසු වන බව පමණක් නොව, එය සුදුසු යැ යි නිර්දේශ කළ හා අනුමත කළ සියලු ආයතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සුරැකීමට දෙන ලද ප්‍රතිඥාව බිඳ දමා ඇති සෙයක් ද කමිටුවට නිරීක්ෂණය වෙයි.

xii. මෙම තත්වය වඩාත් බරපතළ වන්නේ සංයුක්ත ගිවිසුමේ 3.7(c) හා 3.9 වගන්තිවලට අනුව මෙම සංයුක්තයට අදාළ සියලු කටයුතුවල දී භාවිත කෙරෙන තොරතුරුවල හා එම සංයුක්තය ක්‍රියාත්මක කිරීමේ දී නිපැයෙන සියලු දත්ත - සටහන් - සංඛ්‍යා ලේඛන - තොරතුරුවල පූර්ණ බුද්ධිමය දේපොළ අයිතිය MCC වෙත ලැබෙන නිසා ය. විශේෂ වශයෙන් ම, ඉඩම් වැනි සංවේදී හා ජාතික ආරක්ෂාවට හා ආර්ථික ස්වෛරීත්වයට මෙන් ම වර්තමාන හා අනාගත පුරවැසි පරපුර වෙනුවෙන් රජය විසින් භාරකාරත්වය දරන ජාතික දේපොළක් සම්බන්ධ සූක්ෂ්ම තොරතුරු අප රටේ සියලු පුරවැසියන්ටවත් සීමා රහිත ව විවෘත කිරීම නුසුදුසු තත්වයක් තුළ ඒවා කිසිදු වාරණයකින් තොර ව විදේශීය ආයතනයක බුද්ධිමය දේපොළක් බවට පත් කිරීම කිසි සේත් සුදුසු නො වන බව කමිටුවේ අදහසයි. එ බැවින්, එ වැනි වගන්ති සහිත ගිවිසුමක් රජයේ ඉහළ ආයතන තුළ දී හෝ අවම වශයෙන් අමාත්‍ය මණ්ඩලයේ දී වත් නිශේධනය නොවීම කමිටුවට වටහා ගත නො හැකි අනතුරුදායක තත්වයකි. මේ පිළිබඳ විමර්ශනාත්මක නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ලැබී තිබුණේ ද, එ සේ නො තිබුණේ නම් ඒ මන් ද, ඊට මඟ පෑදී ඇත්තේ කෙ සේ ද, සහ එ වැනි තත්වයක් යළි ඇති වීම වැළැක්වීමට කවර පියවරක් ගත යුත්තේ ද යන ගැටලු රජයේ හා ඉහළ නිලධාරීන් ගේ කඩිනම් හා සමීප අවධානයට යොමු විය යුතු මාතෘකා බව කමිටුව අවධාරණය කරයි.

xiii. මෙම ගිවිසුමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත්තේ ඊට අදාළ ශ්‍රී ලංකා රජයේ ආයතන තුළින් නො වේ. අවම වශයෙන් ශ්‍රී ලාංකික සමාගම්වලට සීමා වූ කොන්ත්‍රාත් මගින් ද නො වේ. වෙනත් ද්විපාර්ශ්වික ණය හෝ ආධාර යෝජනාක්‍රම තුළ දක්නට ලැබෙන්නා වූ ඒ ඒ රටවල සැපයුම් සමාගම්වලින් ම සේවා සපයාගත යුතු බවට වන කොන්දේසි මෙම MCC ප්‍රදානයේ කොන්දේසියක් කර නොතිබීම සුබවාදී වන බව සත්‍යයකි. එ නමුදු, ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිශේධනය කරමින් අමෙරිකානු/MCC ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අදාළ වන පරිදි කොන්දේසි පැනවීමෙන් සහ එම ක්‍රියාවලිය ඔස්සේ තෝරා ගැනෙන සැපයුම්කරුවන්ට අනුමැතිය MCC ආයතනය වෙතින් ලබා ගත යුතු වන පරිදි ප්‍රතිපාදන සැකැසීමෙන් එම ධනාත්මක ඉඩකඩ ද නිශේධනය වේ. තව ද, ඉඩම් මැනීම, සිතියම් කිරීම හා දත්ත ගබඩා ඇති කිරීම, මධ්‍යගතව වාහන පාලන ක්‍රමවේද

සැකැසීම වැනි රටේ ජාතික ආරක්ෂාවට හා දේශපාලන-ආර්ථික හා සමාජයීය ස්වෛරීත්වයට බලපෑම් එල්ල කිරීමට යොදා ගනු ලැබිය හැකි තොරතුරු හෝ පරිගණක යෙදවුම් කිසිදු පාලනයකින් හා සීමාවකින් තොර ව විදේශ කොන්ත්‍රාත්කරුවන් ගේ අතට පත්වන ලෙස ක්‍රමවේදය සකසනු ලැබ තිබීම ද සුදුසු නො වන බව කමිටුවේ මතයයි.

xiv. මෙහි දී විශේෂයෙන් අවධානයට යොමු වන්නේ සංයුක්ත ගිවිසුමෙහි (Compact) හා මෙම වාර්තාවේ ඇමුණුම-7 ලෙස අන්තර්ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමෙහි (Program Implementation Agreement or PIA) "වැඩසටහන් වත්කම්" (Program Assets) ලෙස සැලැකෙන (යන්ත්‍ර-උපකරණ-මෙවලම් වැනි ද්‍රව්‍යමය දේපොළ මෙන් ම තොරතුරු-දත්ත-මෘදුකාංග වැනි ද්‍රව්‍යමය නො වන දේපොළ ද ඇතුළත් විය හැක්කා වූ) දෑ සම්බන්ධයෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදනයන් වෙත යි. කිසිදු "වැඩසටහන් වත්කමක්" අමෙරිකා එක්සත් ජනපදයේ ජාතික ප්‍රතිපත්තිවලට සහ ජාතික ආරක්ෂාවට පටහැණිව යොදා ගත නොහැකි බවට සංයුක්තයේ 5.1(b)(iv) සහ 5.1(b)(v) හි සඳහන් වන නමුදු ඒ කිසිවක් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සහ ජාතික ආරක්ෂා අරමුණුවලට පටහැණිව යොදා ගත නොහැකි බවට කිසිදු ප්‍රතිපාදනයක් සකසනු ලැබ නොමැත. මෙම "වැඩසටහන් වත්කම්" සඳහා විශේෂ මුක්තියක් ද හිමිවන පරිදි වගන්ති (සංයුක්තයේ 6.8 හා PIA හි 1.3(ix) වගන්ති) ඇතුළත් කරනු ලැබ ඇති බව ද මෙහි දී අවධානයට යොමු විය යුතු ය. ඒ අනුව, ACSA හෝ SOFA ගිවිසුම්වලින් බලගැන්වෙන ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට හා ජාතික ආරක්ෂාවට හානිකර වීමේ හැකියාව විමසීමට ශ්‍රී ලංකා රජයේ ආයතනවලට ඇති අවස්ථාව අහුරමින් ආනයනය කිරීමට මෙම MCC ගිවිසුමේ ප්‍රතිපාදන උපයෝගී වීමේ ඉඩකඩ කමිටුවේ විමැසුමට ලක් වී ඇත.

xv. මීට අමතර ව, වැඩසටහන් වත්කම් කළමනාකරණය කරන MCA-Sri Lanka සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඡන්ද බලය හිමි සාමාජිකයන් ශ්‍රී ලංකා රජයේ නිලධාරීන් වුව ද ඉහතින් සඳහන් කෙරුණු පරිදි එම අධ්‍යක්ෂවරුන් තුළින් හැරුණු කොට වෙනත් කිසියම් අයුරකින් සමාගමේ හෝ සමාගම විසින් යොදවා ගැනෙන සේවා සැපයුම්කරුවන් ගේ කටයුතුවලට මැදිහත්වීමට <u>ශ්‍රී ලංකා රජයට නොහැකි පරිදි</u> (සංයුක්ත ගිවිසුමෙන් (Compact), වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමෙන් (PIA) සහ ඇමුණුම-8 හි ඇති MCA-Sri Lanka සාංගමික ව්‍යවස්ථා කෙටුම්පතෙන්) ප්‍රතිපාදන සලසනු ලැබ ඇත. මේ තත්වයන් තුළ යොදා ගැනෙන "වැඩසටහන් වත්කම්" නිරායාසයෙන් ම ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට අනුකූල වෙතැයි උපකල්පනය කිරීම ප්‍රඥාගෝචර නොවන බව කමිටුවේ නිරීක්ෂණයයි.

xvi. තව ද, MCA-Sri Lanka සමාගම විසින් හෝ එම සමාගම මඟින් MCC ආයතනයේ අනුමැතිය පරිදි ප්‍රසම්පාදනය කෙරෙන සේවා සැපයුම්කරුවකු විසින් හෝ ශ්‍රී ලංකාවට ගෙන්වන හා යොදාගනු ලබන "වැඩසටහන් වත්කම්" කිසිදු රඳවාගැනීමකට හෝ අවහිරකිරීමකට හෝ යටත් කළ නො හැකි විය යුතු බවට PIA හි 1.2(b)(i) වගන්තියෙන් ශ්‍රී ලංකා රජය බැඳ තබනු ලැබ ඇත. යම් දිනක ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි කටයුත්තකට යොදනු ලැබිය හැකි ද්‍රව්‍යයක් හෝ

උපකරණයක් ඉහතින් සදහන් යම් සැපයුම්කරුවකු හෝ සමාගමක් විසින් "වැඩසටහන් වත්කම්" ලෙස ආනයනය කළහොත් හෝ යොදාගනු ලැබුවහොත් ඒවා සම්බන්ධයෙන් රේගු රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම පවා මේ ප්‍රතිපාදන තුළ අවහිර වීමට ඉඩ ඇති බව කමිටුව අනුමාන කරන අතර, එ සේ නො වනු ඇතැ යි තහවුරු කළ නොහැකි බව ද නිරීක්ෂණය කරයි.

xvii. තව ද, සංයුක්ත ගිවිසුමෙහි (Compact හි) 5.1 හා 5.2 වගන්තිවල හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමෙහි (PIA හි) 5.7 වගන්තියේ ප්‍රතිපාදන අනුව සංයුක්තය අවසන් කෙරෙන විටක දී වැඩසටහන ක්‍රියාත් වීම තුළ නිපයා - සපයා ගත් "වැඩසටහන් වත්කම්" MCC ආයතනය විසින් ඉල්ලනු ලබන විටෙක ඒ ආයතනයට ලබා දීමට හෝ එ සේ කළ නොහැකි නම් ඒවාට අදාළ වෙළඳපොළ වටිනාකම අමෙරිකානු ඩොලර්වලින් MCC වෙත ගෙවීමට හෝ ශ්‍රී ලංකා රජය PIA හි 4.2(d) වගන්තියෙන් බැඳී සිටිනු ඇත. ඒ අනුව, උදාහරණයක් ලෙස "වැඩසටහන් වත්කම්" ලෙස සලකනු ලැබිය හැකි රජයේ ඉඩම් පිළිබඳ දත්ත, දත්ත ගබඩා, මෘදුකාංග, සිතියම් වැනි තොරතුරු මෙන් ම ඒවායේ ස්ථානීය පිහිටීම අනුව වාණිජමය වශයෙන් පමණක් නොව ජාතික ආරක්ෂාව පිළිබඳ දිශානතියෙන් ද ඉතා සංවේදී හා වටිනාකමන් සහිත විය හැකි සිතියම්, සැලසුම් හා දත්ත ද, මෙම ප්‍රතිපාදනය යටතේ MCC ආයතනය සතු කර ගැනීමට ඇති ඉඩකඩ බැහැර කළ නොහැක.

xviii. එබැවින්, ඉහත (xi), (xii), (xiii), (xiv), (xv) හා (xvi) හි විමැසීමට ලක් කෙරුණු මෙ වැනි ප්‍රතිපාදනයන් පිළිගත නොහැකි බව ද, ජාතික ආරක්ෂාවේ දෘෂ්ටිකෝණයෙන් අතිශය වැදගත් හා සංවේදී විය හැක්කා වූ මෙ වැනි උපාය මාර්ගික පැතිකඩ පිළිබඳව රාජ්‍ය පද්ධතියේ කවර ආයතන මඟින් කවර පමණකට විශ්ලේෂණය කර බලා තිබේ ද යන්න සොයා බැලීම ඉතා වැදගත් බව ද, කමිටුව නිර්දේශ කරයි.

xix. ඉහතින් විග්‍රහ කෙරුණු ගැටලු සමූහයට පාදක වන්නේ (අ) රජයේ පාලනයට අතේ දුරට ඔබ්බෙන් තැබෙන "ස්වාධීන" යැ යි හැඳින්වෙන ඒකකයක් තුළින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බවට හා (ආ) මෙම ගිවිසුම් හා ක්‍රමවේදය පාර්ලිමේන්තු පනතක් ලෙස නීතිගත කළ යුතු බවට, කර තිබෙන ආකෘති සැලසුම බව කමිටුවේ මතයයි. ඒ නිසා, MCC ප්‍රතිදාන යෝජනාව සම්බන්ධයෙන් ද අනෙකුත් රටවලින් ලැබෙන විදේශ ප්‍රතිදාන හෝ ණය ආධාර ක්‍රම ශ්‍රී ලංකාව තුළ පරිපාලනය කෙරෙන හා ක්‍රියාත්මක කෙරෙන රජයේ සාමාන්‍ය ආකෘතිය හා ක්‍රමවේදය යොදා ගත යුතු බව ද, එ සේ නොමැතිව පසුගිය 2019 ඔක්තෝබර් 29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ක්‍රමවේදය යොදා ගැනීම කිසිසේත් නිර්දේශ කළ නොහැකි බව ද කමිටුව අවධාරණය කර සිටියි.

## 4.2 MCC යෝජනාවලියට ඇතුළත් වී ඇති ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ

i. ආරම්භයේ දී සඳහන් කෙරුණු පරිදි දිළිඳු කම දුරලීමේ හා වෘද්ධි වේගය ඉහළ නැංවීමේ අරමුණු ඉදිරියේ බාධක ලෙස පවතින්නේ යැ යි සැලැකුණු සංරෝධක ඉවත්කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය විසින් මැදිහත්වීම් යෝජනා හයක් MCC වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අතර MCC විසින් ඒ අතරින් (අ) ඉඩම් පරිපාලනය

ප්‍රතිසංස්කරණ යෝජනා සහ (ආ) ප්‍රවාහන සංවර්ධන යෝජනා යන මැදිහත්වීම් ද්වය, ඒ හා අදාළ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ද සහිත ව, MCC ප්‍රදාන තුළින් ක්‍රියාත්මක කිරීම පිණිස තෝරා ගනු ලැබ ඇත.

ii. පළමු කොට ම කමිටුවේ නිරීක්ෂණයට භාජනය වූයේ මෙම මැදිහත්වීම් දෙක මූලික සංරෝධක අතර ද හඳුනාගනු ලැබ තිබූ බවයි. එ සේ ශ්‍රී ලංකා රජය විසින් සිය ආයතනික ව්‍යුහය තුළින් ප්‍රමුඛතා සංරෝධක විධිමත් ලෙස හඳුනාගනු ලැබ තිබුණේ නම් ඉන් අනතුරුව නැවත ද වරක් රජයේ ම යෝජනා ලෙස වෙනත් දිශානතියක මැදිහත්වීම් ව්‍යාපෘති යෝජනා හතරක් MCC වෙත ඉදිරිපත් කෙරුණේ මන් ද යන්න ගැටලුවකි. තව ද, ශ්‍රී ලංකා සමාජ-ආර්ථික දේහයේ ප්‍රගමනයට අදාළ ඉහළම ආයෝජන ප්‍රමුඛතා ලෙස සැලකිය හැකි වෙනත් බොහෝ ක්ෂේත්‍රවල ආයෝජන අවස්ථා මෙම තෝරා ගැනීම් අතර නොතිබීම ගැටලු සහගත බව එවක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2019 අගෝස්තු 23 දිනැති පත්‍රිකාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි ද නිරීක්ෂණය වී ඇත. ඒ අනුව, මෙම තෝරාගැනීම් සැබෑ ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා ද නො එසේ නම් MCC හි ප්‍රමුඛතා ද යන්න පිළිබඳව පැන නැඟී ඇති සැකය සාධාරණීකරණය විය හැකි බව කමිටුවේ මතයයි.

iii. කෙ සේ වෙතත්, අවසානයේ දී මෙම තෝරා ගැනීම් ශ්‍රී ලංකාව විසින් යෝජිත බව පෙනී යන ලෙස සඳහන් වෙන බැවින් ඒවායේ සුදුසු-නුසුදුසු කම් පිළිබඳ වගකීම ඍජු ව ශ්‍රී ලංකාව වෙත පැවැරෙන බව කමිටුවේ නිගමනයයි.

iv. එම මැදිහත්වීම් ව්‍යාපෘති රටේ ප්‍රමුඛ අවශ්‍යතාවන් නම් MCC ප්‍රතිදාන ඇතිව හෝ නොමැතිව ඒවා ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වෙයි. එ වැනි තත්වයක් තුළ කිසිදු ආපසු ගෙවීමක් අවශ්‍ය නොවන බවට අවම වශයෙන් ප්‍රකාශිත ව සඳහන් කර තිබෙන MCC ප්‍රදාන යොදා ගැනීම වෙනත් පොළී හා ප්‍රසම්පාදන බැඳීම් කොන්දේසි සහිත ණය පහසුකමක් යොදා ගැනීමට වඩා මූල්‍යමය වශයෙන් වාසිදායක බව මතුපිටින් පෙනී යා හැකි බැවින් මෙම ව්‍යාපෘති යෝජනා පිළිබඳව ද සංක්ෂිප්ත වශයෙන් අදහස් දැක්වීමට කමිටුව අදහස් කරයි.

### 4.2.1 ඉඩම් පරිපාලනය ප්‍රතිසංස්කරණ යෝජනා

i. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අටක් ඇතුළත් වෙන පරිදි ඉඩම් පරිපාලනය පිළිබඳ කටයුතු විධිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ එක් මුඛ්‍ය අරමුණකි. ලංකා වාණිජ මණ්ඩලය ඇතුළු පෞද්ගලික අංශය නියෝජනය කරන බොහෝ අයවලුන් ගේ මතය ශ්‍රී ලංකාවේ ඉඩම් කළමනාකරණයේ ඇති දුර්වලතා රටේ සංවර්ධනයට අවශ්‍ය ආයෝජන ලබා ගැනීම හමුවේ බලවත් සංරෝධකයක් බවයි.

ii. කෙ සේ වුව ද, මෙම සමස්ත MCC ක්‍රියාවලියට සමාජයෙන් එල්ල කෙරෙන ප්‍රබලතම විරෝධයට පාදක වන්නේ ද මෙම ඉඩම් ක්ෂේත්‍රයේ කිරීමට යෝජිත මැදිහත්වීම වග අමතක නො කළ යුතු බව කමිටුවේ අදහසයි.

iii. රජයේ හෝ පෞද්ගලික ඉඩම් උපායමාර්ගිකව හා ජාතික වශයෙන් ඉතා වැදගත් හා තීරණාත්මක සාධකයකි. රටේ ඉඩම් පිළිබඳ ජාතික අයිතිය අතීත සිංහල

රාජ්‍ය සමයේ පටන් පැවැතුණකි. ඒ පිළිබඳව රජයට පවා තිබුණේ භාරකාරත්වය විනා සින්නක්කර අයිතිය නො වන බව "The Adaptable Peasant: Agrarian Society in Western Sri Lanka Under Dutch Rule, 1740-1800" නමැති සිය කෘතියෙන් (107-109 පිටු) ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා පවසයි. එ බැවින්, විශේෂයෙන් රජයේ ඉඩම් වෙළඳපොළ යාන්ත්‍රණයක් තුළින් හුවමාරුවීමක් යනු අපේ ඓතිහාසික උරුමයට පිටුපෑමකි. තව ද, අනාගත පරපුරේ හා ජාතියේ ස්වෛරීත්වය උදෙසා තව දුරටත් පොදු අයිතියේ තිබියයුතු සම්පතක් අවදානමේ හෙළීමකි.

iv. මේ තත්වය කවරක් වුව ද, පවත්නා ඉඩම් ඒවායේ පරිපාලන, නෛතික හා කළමනාකරණ පහසුව උදෙසා මැන, සැලසුම් සිතියම් සකසා, පරිගණකගත කර දත්ත පද්ධතියක් ගොඩනගා ගැනීම සම්බන්ධව ගැටලුවක් තිබිය හැකි නො වේ.

v. එහෙත්, පහත සඳහන් අංශ පිළිබඳව ප්‍රශ්නකාරී තත්වයන් තිබෙන බව කමිටුව නිරීක්ෂණය කරයි:

(අ) <u>ජාතික ආරක්ෂාව වෙනුවෙන් හෝ වෙනත් උපායමාර්ගික වැදගත්කමක් වෙනුවෙන් රජය භාරයේ පමණක් තිබිය යුතු ඉඩම් තොරතුරු</u>

ඉහතින් ද විස්තර කර ඇති පරිදි ඉඩම් පිළිබඳ සියලු තොරතුරු සීමාවකින් තොර ව පොදුවේ ප්‍රසිද්ධ කිරීම හා නිදහසේ ලබා ගැනීමට පහසුකම් සැලසීම නුවණට හුරු නො වීමට ඉඩ ඇත. එ වැනි සුවිශේෂී හා සංවේදී ඉඩම් පිළිබඳ තොරතුරු රහසිගත ව රජයට පමණක් භාවිතා කළ හැකි පරිදි සුරක්ෂිතව තබා ගත යුතු ය. යෝජිත ක්‍රමවේදය ඔස්සේ මැනෙන හා පරිගණක දත්ත ගබඩාගත කෙරෙන ඉඩම් සියල්ලේම බුද්ධිමය දේපොළ අයිතිය MCC ආයතනයට හිමි වන බැවින් යෝජිත MCC වැඩසටහන තුළින් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ජාතික ආරක්ෂාව පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලද්දී නිර්දේශ කළ නො හැක.

(ආ) <u>බලපත්‍ර යටතේ ගොවීන් විසින් භුක්ති විඳිනු ලබන වගා ඉඩම්වලට සින්නක්කර ඔප්පු ප්‍රදානය</u>

දේශපාලනික වශයෙන් ආකර්ෂණීය වුව ද මෙම පියවර ඉඩම් අහිමි ගොවි පරපුරක් ඉදිරියේ දී ඇති කෙරෙන මූලික පියවරක් වීමට ඉඩ ඇත. 1998 දී ලෝක බැංකුව විසින් ගෙන එන ලද වැවිලි නොවන කෘෂිකර්ම පිළිවෙතෙහි පටන් MCC දක්වා විටින් විට මෙම ඉඩම් සින්නක්කරකරණ යෝජනා ඉදිරිපත් වෙයි. අඩු ඒක-පුද්ගල ආදායම් ඇති ආදායම් බෙදී යාමේ විෂමතා සහිත රටක, දරිද්‍රතාවෙන් හා ණය බරින් මිරිකුණු සමාජයකට ඉඩම් සින්නක්කර අයිතිය ලබාදීමෙන් රට තුළ ඉඩම් ධනවතුන් විසින් මිල දී ගැනීමට ඉහළ සම්භාවිතාවක් ඇත. ඒ අනුව, දැනටමත් මුදලාලීන්ට ණය වී ඇති ශ්‍රී ලාංකික ගොවීන් ගේ වගා ඉඩම් ඒවාට සින්නක්කර ඔප්පු දුන් වහාම මුදලාලිලාට සින්න වනු ඇත. ඒ තුළ ඉඩම් සමුච්චයකරණයට (land accumulation) සහ ඉඩම් අහිමි ශ්‍රම හමුදාවක් බිහිවීමට මඟ පැදෙයි. සංවර්ධිත රටවල පුරවැසියන්ට සිය ඩොලර් ඉපැයුම් අනුව සලකා බලන

කල මෙරට ඉඩම් සාපේක්ෂව ඉතා ආකර්ෂණීය වන තරමට ම අඩු මිල ගණන් සහිත වනු ඇති බැවින් මෙ සේ වෙළෙඳපොළට විවෘත වෙන ශ්‍රී ලංකාවේ ඉඩම් ක්‍රමානුකූල ව විදේශීය ඩැහැගැනීමට (land grabbing by foreigners) පවා දොරටු විවර විය හැකි ය (මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන් විසින් BiZnomics– Nov/Dec 2019 සඟරාව වෙත සැපැයුණු ලිපියකින් මේ ඉඩකඩ පෙන්වා දී ඇත). ශ්‍රී ලංකාවේ ගාලු කොටුව තුළ සිදු වී ඇති ඉඩම් විදේශකරණය සහ මැඩගස්කරයේ MCC ප්‍රදානය ඔස්සේ සිදු වී ඇතැ යි පැවැසෙන ඉඩම් ඩැහැගැනීම මේ තත්වයට නිදසුන් විය හැකි ය. නව ලිබරල්වාදී දේශපාලන-ආර්ථික න්‍යායයන්ට අනුව ආර්ථිකයේ පරිමාණානුකූල වාසි උදෙසා සහ අඩු-මිල ශ්‍රම හමුදාවක් ඇති කර ගැනීම පිණිස මෙම තත්වය උපකාරී විය හැකි වුව ද ඒ තුළින් සමාජ-ආර්ථිකමය වශයෙන් හා ජාතික ඉඩම් අයිතියේ දෘෂ්ටිකෝණයෙන් ඉතා අහිතකර තත්වයක් උදා වීමට ඇති ඉඩකඩ ද සුළු-පටු නැත.

(ඈ) <u>රජය විසින් පසුගිය 2014 වසරේ සැකැසුණු ව්‍යාපෘතියට වූ ඉරණම</u>

ආර්ථික සංවර්ධන දිශානතියෙන් වාසිදායක බවට ඉහතින් සඳහන් කෙරුණු මිනුම් කටයුතු වේගවත් කිරීම, ඒවා සඳහා ඔප්පු සැකසීම සහ තෝරාගත් ඉඩම් සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් ගොඩනැඟීම, වැනි "බිම් සවිය" වැඩසටහනේ කොටසක් ලෙස රජය විසින් දැනටමත් සිදු කෙරෙමින් යන වැඩපිළිවෙළ වේගවත් කිරීම අවශ්‍ය යැ යි තීරණය කර තිබුණු බැවින් 2014 අග වන විට රජයේ මුදල් ප්‍රතිපාදන ඔස්සේ රාජ්‍ය ආයතන තුළින් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ පියවර ගෙන තිබූ බව කමිටුව හමුවේ අදහස් දැක්වූ හිටපු මිනුම්පති විසින් පවසන ලදී. ඒ උදෙසා සියලු කටයුතු නිමකොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය පවා ලබා තිබූ බවත් ඉතිරි ව තිබුණේ අදාළ ආයතනයට ප්‍රදාන ලිපිය අත්සන් කර පිරිනැමීම පමණක් බවත් හෙතෙම පැවැසී ය. ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ නම් අවශ්‍ය අංශයන් හි රහස්‍ය භාවය තහවුරු කරමින් අදාළ ඉඩම් පරිපාලන ප්‍රතිසංස්කරණය සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගත හැකිව තිබූ බව පෙනී යයි. තත්වය එ සේ තිබිය දී 2015 දී බලයට පත් වුණු නව රජය විසින් ඒ ව්‍යාපෘතිය අත හැර දමන ලද්දේ MCC අරමුදල් මත මෙම කටයුත්ත කිරීමේ අරමුණින් ම ද යන ප්‍රශ්නය නිතැතින් ම පැන නඟින බව කමිටුවේ නිරීක්ෂණයයි.

### 4.2.2 ප්‍රවාහන සංවර්ධන යෝජනා

ප්‍රවාහන සංවර්ධනය පිළිබඳ යෝජිත ව්‍යාපෘති ඉහත සඳහන් ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති හා සැසැඳීමේ දී ඉතා අඩු වශයෙන් විවේචනයට ලක් වී තිබීම කමිටුවේ අවධානයට ලක් වෙයි. කෙ සේ වෙතත්, ප්‍රවාහන පද්ධති යෝජනා තුළ ද පහත දැක්වෙන අඩු ලුහුඬුකම් තිබෙන බව පෙනී යයි:

i. පොදු ප්‍රවාහන මාධ්‍යයක් වූ දුම්රිය පද්ධතිය පිළිබඳව අවධානය යොමු නො වීම

ii. මාර්ගයන් හි රථවාහන පාලන යන්ත්‍රණය පිළිබඳව රහස්‍ය යැ යි සහ උපායමාර්ගිකව මෙන් ම ආරක්ෂාව සම්බන්ධව වැදගත් යැ යි තීරණය විය හැකි තොරතුරු හා ඒවායේ අයිතිය ඉහත 4.1(xi) සහ 4.1(xii) හි දැක්වෙන අයුරු MCC ආයතනය වෙත ලැබීම වැළැක්විය නො හැකි වීම

iii. විදේශ ආධාර ව්‍යාපෘතියක් තුළින් විසඳිය යුතු මට්ටමට ම ඉහළ කාන්තා හිංසනයක් ඇති පොදු ප්‍රවාහන පද්ධතියක් සහිත රටක් බව ශ්‍රී ලංකාව තම පාර්ලිමේන්තුවේ ම පනතක් ලෙස සම්මත කරගන්නා වූ මෙම ද්විපාර්ශ්වික ගිවිසුමෙන් තමන් විසින් ම පිළි ගැනීම.

## 4.3 MCC යෝජනාවලිය ගොඩනැඟීම ක්‍රමවේදය පිළිබඳ නිරීක්ෂණ

ශ්‍රී ලංකාව සහශ්‍රක අභියෝගතා පර්යන්ත පහසුකමකට (MCC Threshold Facility) සුදුසුකම ලැබීම පිළිබඳව ශ්‍රී ලංකා රජයට දැන්වූ 2015 දෙසැම්බර් මාසයේ සිට 2019 ඔක්තෝබර් තෙක් MCC ආධාර ලබාගැනීමට ශ්‍රී ලංකා රජය විසින් අනුගමනය කර ඇති ක්‍රියාදාමය ද කමිටුවේ විමැසුමට භාජනය විය. එම විමැසුමේ දී කමිටුවේ නිරීක්ෂණයට ලක් වුණු සුවිශේෂී කරුණු පහතින් සාරාංශ කොට දැක්වෙයි:

i. පර්යන්ත පහසුකමකට සුදුසුකම් ලද ශ්‍රී ලංකාවට MCC ක්‍රමවේදය යටතේ සංරෝධක ඇගැයීමක් (Constraint Analysis) සිදු කිරීමේ දී හා විකල්ප අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ රජයේ ආයතන විසින් කරනු ලැබ ඇති කාර්යභාරයන් අපැහැදිලි බව කමිටුවේ අදහසයි. එම සංරෝධක අමෙරිකාවේ හාවඩ් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රයේ (Harvard University Centre for International Development or HUCID) සහය ඇතිව ශ්‍රී ලංකාවේ අදාළ රාජ්‍ය ආයතන විසින් කරනු ලැබ ඇති හඳුනා ගැනීම් බව පැවැසුණ ද, කමිටුවේ නිරීක්ෂණය වන්නේ ඒවා ශ්‍රී ලංකාවේ ආයතනවල සහය ලබමින් හාවඩ් විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය විසින් කරනු ලැබ ඇති හඳුනාගැනීම් විය හැකි බව යි.

ii. පර්යන්ත පහසුකමට 2015 දී ලද සුදුසුකම 2017 වසරේ දී සංයුක්ත පහසුකමක් (Compact Facility) තෙක් පුළුල් කරන ලද පසු MCC වෙත ශ්‍රී ලංකා රජය විසින් ඉදිරිපත් කෙරුණු සංරෝධක දුරලීමේ ව්‍යාපෘති යෝජනා හය අතරින් ක්‍රියාවට නැංවීම සඳහා තෝරා ගන්නා ලද ඉඩම් හා ප්‍රවාහන ක්ෂේත්‍ර දෙක ප්‍රමුඛතා ලෙස තෝරා ගැනුණු ක්‍රමවේදය ද අපැහැදිලි ය. ඒ තේරීම ආර්ථිකමය ප්‍රතිලාභ අනුපාත (Economic Rate of Return or ERR) අනුපිළිවෙළ අනුව සිදු කරන ලද බව පැවැසුණ ද, ඒවා ප්‍රවාහන ක්ෂේත්‍රය හා ඉඩම් පරිපාලනය ට අදාළව පිළිවෙළින් 19% හා 26% ලෙස (සංයුක්ත ගිවිසුම, ඇමුණුම-III, පිටු අංක 48-49) සඳහන් වුව ද, ඒ පිළිබඳ සංසන්දනාත්මක දත්ත හා වාර්තා සහිත තොරතුරු කමිටුව වෙත ලබා දීමට ශ්‍රී ලංකාව වෙනුවෙන් මෙම කර්තව්‍යය මෙහෙයවා ඇති සංයුක්ත සංවර්ධන කණ්ඩායම (Compact Development Team) හෝ වෙනත් කිසි යම් රාජ්‍ය ආයතනයක් මෙ තෙක් පියවර ගෙන නැත.

iii. ඒ සේ ම, මෙම MCC සංයුක්ත ගිවිසුම (Compact), ඊට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (Program Implementation Agreement or PIA), හා ක්‍රියාන්විතය මෙහෙයවීම උදෙසා ස්ථාපනය කිරීමට යෝජිත MCA-Sri Lanka නමැති ඇපයෙන් සීමිත සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලි කෙටුම්පත (Articles of Association) සකස් කිරීම පිළිබඳ "හිමිකාරත්වය" භාර ගැනීමට හෝ ඒවායේ අන්තර්ගතයන් පිළිබඳ වගකීම දැරීමට හෝ සූදානම් කිසිදු රාජ්‍ය ආයතනයක් මෙතෙක් කමිටුවට හමු වී නැත.

iv. ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘති හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒ ඒ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකේය ආයතනයන් හි බලධාරීන් අදාළ ක්ෂේත්‍රීය රාමු තුළ සාධාරණීකරණය කළ ද, ඒ යෝජනා දේශයේ ස්වෛරීත්වය - ජාතික ආරක්ෂාව - ආර්ථික ස්වාධීනත්වය - සමාජ සුභසිද්ධිය ඇතුළු සමස්ත ජාතික අරමුණුවලට සාපේක්ෂව සාර්ව රාමුවක් තුළ කිසිදු රාජ්‍ය ආයතනයක් විසින් විග්‍රහ කර ඇති බවක් කමිටුවට නිරීක්ෂණය නො වී ය. උදාහරණ ලෙස, සියලු ඉඩම්වල තොරතුරු අසීමාන්තික ව ඕනෑම අයකුට ලබා ගත හැකි පරිදි පරිගණක දත්ත ගබඩාගත කිරීම රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් සුදුසු නොවන බව හිටපු මිනුම්පතිවරයා, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මේ පිළිබඳ දැනුම්වත් වර්තමාන නිළධාරීන් ද කමිටුව හමුවේ ප්‍රකාශ කළ ද, එ වැනි අන්තර්-ක්ෂේත්‍රීය ඇගැයීමක් මේ සම්බන්ධයෙන් කිසියම් හෝ රාජ්‍ය ආයතනයකින් සිදු කෙරී ඇති බවක් කමිටුවට නිරීක්ෂණය නො වී ය.

v. විශේෂ වශයෙන්, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ සාර්ව ඇගැයීමක් සඳහා කේන්ද්‍රීය ව ස්ථාපනය කරනු ලැබ ඇති ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හෝ විදේශ ප්‍රතිදාන හා ණය ක්‍රම කළමනාකරණය කිරීමේ වගකීම උසුලන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හෝ මෙම ගිවිසුම් කෙටුම්පත් කිරීමට හෝ ව්‍යාපෘති ඇගැයීමට හෝ ඒවා ප්‍රමුඛතාකරණය කිරීමට හෝ ආයතනික වශයෙන් දායක වී ඇති බවක් කමිටුවට දැනගන්නට නැත. මෙ වැනි සාර්ව ඇගැයීමකින් තොර ව ගිවිසුම් අත්සන් නොකළ යුතු බවට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා නිරීක්ෂණ මඟින් කිහිප අවස්ථාවක දී කර තිබෙන නිරීක්ෂණ හා නිර්දේශයන් ද අනුගමනය වී නැත.

vi. තව ද, විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මේ කටයුත්තේ දී මැදිහත් වී ඇත්තේ කවර ආකාරයකට සහ කවර පමණට ද යන්න මේ වන විට අධ්‍යයනය කෙරෙමින් පවතී.

vii. එ සේ ම, ප්‍රස්තුත ගිවිසුම් කොන්දේසි ශ්‍රී ලංකාවේ නෛතික රාමුවට අනුකූල බව හෝ අනුකූල නො වේ නම් ඒ කවර දුරකට ද යන වග සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් විටින් විට නිකුත් වී ඇති මතයන් ද මෙම තත්වය පැහැදිලි කර ගැනීමට කමිටුවට ප්‍රමාණවත් ලෙස උපකාර නො වන තත්වය තුළ කමිටුව විසින් සිදු කරන ලද්දා වූ (ඉහත 4.1 හි ද සඳහන් වී ඇත්තා වූ) යම් යම් සුවිශේෂී නිරීක්ෂණ පිළිබඳව ගරු නීතිපතිතුමා ගේ විමර්ශනාත්මක නිරීක්ෂණ හා

මතයයන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2020 ජනවාරි 20 වැනි දාතම සහිත ඉල්ලීමක් අග්‍රාමාත්‍ය ලේකම්තුමා වෙත යොමු කරනු ලැබ ඇත. ඒ පිළිබඳ ප්‍රතිචාරය ඉදිරියේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂිත ය.

## 4.4 MCC ප්‍රදාන පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම

4.4.1 සහශ්‍රක අභියෝගතා සමායතනයේ (MCC) නිල වෙබ් අඩවියේ සඳහන් පරිදි මේ වන විට රටවල් 44 ක් විසින් MCC සංයුක්ත හා පර්යන්ත පහසුකම් ලබාගෙන වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඉන් සමහර රටවල් එක් පහසුකමක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව දෙ වැනි පහසුකමක් ද ලබාගෙන ඇත. ඒ අතර නයිජර්, යේමනය, මොරිටානියාව, ගැම්බියාව, ටැන්සානියාව, නිකරගුවාව, හොන්ඩුරාස්, මැඩගස්කරය, ආර්මේනියාව, මාලි හා මලාවි යන රටවල් සමඟ ඇති කරගෙන තිබූ සංයුක්තයන් බිඳ වැටී හෝ අතරමඟ නතර වී ඇති බව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් 2019 අගෝස්තු 23 දින ඉදිරිපත් කරන ලද අංක PS/CP/180/2019 සහිත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමු කර තිබූ විස්තරාත්මක වාර්තාවෙහි සඳහන් වේ. තව ද, පිලිපීනය ද තමන් අත්සන් කළ ගිවිසුම පිළිබඳ ව සුබවාදී ව නො බලන බව එම රටේ ජනාධිපතිවරයා ඒ සම්බන්ධයෙන් කර තිබෙන ප්‍රකාශයන් ගෙන් ගම්‍ය වේ.

4.4.2 මේ බොහොමයක් ප්‍රදාන පොදු ආකෘතියක සංයුක්ත ගිවිසුම් හා ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම් මත සිදු කෙරී ඇති බව නිරීක්ෂණය වේ. ඒ සියල්ල අත්සන් කර ඇත්තේ අඩු ආදායම් සහිත රටවල් සමඟිනි. පොදු අරමුණු වී ඇත්තේ දිළිඳු කම තුරන් කිරීම හා ආර්ථික වෘද්ධිය වේගවත් කිරීමයි. එහෙත් 2020 ජනවාරි 7 දින ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය ආර්ථික විද්‍යාර්ථී සංසදය (SLFUE) විසින් MCC යෝජනාවලිය පිළිබඳව ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ පවත්වන ලද සම්මන්ත්‍රණයේ දී (ආචාර්ය ප්‍රියංග දුනුසිංහ විසින් ඉදිරිපත් කරන ලද ආර්ථිකමිතික විශ්ලේෂණය අනුව) හෙළිදරව් වූයේ MCC සුදුසුකම් ලබන රටවල් අතරින් එම ප්‍රදාන ලබා ගෙන නැති රටවලට සාපේක්ෂව ප්‍රදාන ලබා ගත් රටවල දිළිඳු කම අඩුවීමක් හෝ වෘද්ධි වේගය වැඩි වීමක් හෝ නිරීක්ෂණය නො වන බවයි.

4.4.3 එම තත්වය යථාර්ථය නම්;

(අ) ඕනෑම අවස්ථාවක MCC ආයතනය විසින් ගිවිසුම අත්හිටුවීමට ඇති ඉඩකඩ හා එ සේ ඉවත් වූ විටෙක මේ සම්බන්ධ සේවා සැපයුම්කරුවන්ට තම අරමුදල්වලින් ගෙවීමට සිදුවීමේ අර්බුදයට මුහුණපෑමට සිදුවීමේ අවදානම දරාගනිමින්, සහ

(ආ) වැඩසටහන් වත්කම් පිළිබඳ බුද්ධිමය දේපොළ අයිතිය අහිමි වීම ද ඇතුළු ජාතික ස්වෛරීත්වයට හා ආරක්ෂාවට පවා බලපෑම් එල්ලවිය හැකි ක්‍රියාන්විත නෛතික කොන්දේසි සහිත ගිවිසුම් වලට යටත් වෙමින්;

මෙම ප්‍රදානයන් ලබා ගැනීම කෙතරම් ප්‍රතිඵලදායක වනු ඇති දැ යි විමසිය යුතුව ඇත.

4.4.4 එ සේ ම;

(අ) භූ-දේශපාලනික වටාපිටාව සහ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම ජාත්‍යන්තර බල අරගලයක දී අදාළ තරගකරුවන්ට වැදගත් විය හැකි ආකාරය,

(ආ) ඒ නිසා එ වැනි බල කඳවුරු ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය වීමට දරනු ලැබිය හැකි යුදමය හා ආර්ථිකමය උනන්දුව,

(ඇ) ඉන්දු-පැසිෆික් මූලෝපායෙහි ප්‍රකාශිත ව තිබෙන අමෙරිකානු ජාත්‍යන්තර දේශපාලනික අරමුණු, සහ

(ඈ) අංක MNPEA/2018/152 සහ 2018/09/17 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් ප්‍රකාශිත කොළඹ - ත්‍රිකුණාමලය කොරිඩෝවේ ඉඩම් බලපත්‍ර හා දීමනා පුද්ගලික අයිතියට පරිවර්තනය කිරීමේ යෝජනාව, දැනටමත් (2017 දී) අත්සන් කර ඇතැ යි පැවසෙන ACSA ගිවිසුමේ හා සංශෝධනය කර අත්සන් කිරීමට යෝජිත SOFA ගිවිසුමේ ප්‍රතිපාදනයන් ක්‍රියාවට නැංවීමේ දී සම්බන්ධ වීමට ඉඩ ඇති ආකාරය (අවම වශයෙන් කල්පිතයන් ලෙස හෝ) ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක විශ්ලේෂණ ආයතන විසින් හදාරනු ලැබීම වැදගත් ය.

## 5. මූලික නිගමන හා නිර්දේශ

ඉහත නිරීක්ෂණයන් තුළින් පහත සඳහන් අන්වේෂණයන්ට, ඒවායේ නිරවද්‍යතාව ඉදිරියේ දී වඩාත් තහවුරු කිරීමට යටත් ව, එළැඹීමට කමිටුවට හැකි වෙයි:

i. ප්‍රාග්ධන සම්පත් හිඟ සහ ණය බරින් පෙරපුණු ශ්‍රී ලංකාවේ මූලික ආර්ථික සංවර්ධක දුරලීමේ ආයෝජන උදෙසා අවශ්‍ය මූල්‍ය සම්පත් රටේ විදේශ ණය බර වැඩි නොකරමින් සපයා ගැනීමේ හැකියාව MCC යෝජනාව තුළ ඇති නමුදු, ශ්‍රී ලංකාවේ අදාළ රාජ්‍ය ව්‍යුහයන් තුළ මෙම යෝජනාවලිය ප්‍රමාණවත් ගැඹුරකින් හෝ පළලකින් දේශයේ අවශ්‍යතාවන්ට සාපේක්ෂව සාර්ව වශයෙන් ඇගැයීමකට ලක් වී නැති බව හෝ ඒ දිශානතියෙන් යම් ඇගැයීමක් සිදු වී ඇත් නම් එය ප්‍රමාණවත් නොමැති බව,

ii. ඒ අනුව, මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් හා අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් රටේ අනාගතයට, ජාතික ආර්ථිකයට හා දේශයේ ස්වෛරීත්වයට විය හැකි වාසිදායක හෝ අවාසි දායක බලපෑම් ශ්‍රී ලංකාව වෙනුවෙන් රජයේ පාර්ශ්ව විසින් නිසි හා ප්‍රමාණවත් පරිදි අධ්‍යයනය කරනු ලැබ නොමැති බව,

iii. මෙම ගිවිසුම් වලට අත්සන් තැබීමට පෙර ඉහත (ii) හි සඳහන් අයුරු විමර්ශනයක් සිදු කළ යුතු යැ යි ද, එ සේ නො කර ගිවිසුම්වලට එළැඹීම රටට හානිකර විය හැකි යැ යි ද එවක අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් කිප විටකදීම පත්‍රිකා මඟින් හා සටහන් මඟින් අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කරනු ලැබ ඇති බව සහ 2019 ඔක්තෝබර් මස 29 වැනි දින MCC ගිවිසුම් අත්සන් කිරීමේ තීරණය ගනු ලැබ ඇත්තේ අතිගරු ජනාධිපතිතුමා ගේ ඒ අදහස් හා නිර්දේශ නොසලකා හරිමින් බව,

iv. 2019 වසරේ දී අතිගරු ජනාධිපතිතුමන් විසින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට ඉදිරිපත් කරනු ලැබූ ඉහත (iii) හි සඳහන් වාර්තාවෙන් ද පෙන්වා දී ඇති පරිදි, MCC සංයුක්ත ගිවිසුම (MCC Compact), වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (PIA) සහ ක්‍රියාත්මක කිරීම් ඒකකය ලෙස යෝජිත MCA-Sri Lanka සමාගමේ සාංගමික ව්‍යවස්ථාව එක් ව විශ්ලේෂණය කිරීමේ දී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවට මෙන් ම රටේ පවත්නා නීති පද්ධතියට ද පටහැණි ක්‍රමවේදයන් යොදා ගැනීමට අපේක්ෂිත අයුරු කමිටුවට නිරීක්ෂණය වන බව,

v. ඒ සේ වී ඇත්තේ MCC ප්‍රදාන යෝජනාව හා අදාළ ගිවිසුම් ගොඩනැඟීම බොහෝ විට අමෙරිකා එක්සත් ජනපදයේ ආයතනික රාමු තුළින් සිදු කෙරී ඇති නිසා සහ ඒ ගිවිසුම් කෙටුම්පත් ඒ රටේ උපාය මාර්ගික අරමුණු (විශේෂයෙන්, ඉන්දු-පැසිෆික් මූලෝපාය) වෙත යොමු වී ඇති නිසා විය හැකි බව,

vi. ඒ අනුව, මෙම යෝජනාවලිය ක්‍රියාත්මක වීම කළමනාකරණය උදෙසා ඉදිරිපත් කරනු ලැබ ඇති ගිවිසුම් තුළ සහ යෝජිත ක්‍රමවේදය තුළ ශ්‍රී ලංකාවට එකඟ විය නොහැකි කොන්දේසි අන්තර්ගත වී ඇති බව පෙනී යන හෙයින් ඒ වැනි කොන්දේසි යටතේ මෙම ප්‍රදානය ලැබීම උදෙසා ගිවිසුම්ගත වීම නුසුදුසු බව,

vii. තව ද,

(අ) MCA-Sri Lanka සමාගම ශ්‍රී ලංකා රජයේ පාලනයෙන් දුරස් කර තැබෙන අයුරින් සහ එය MCC ආයතනයේ උපදෙස් - මඟ පෙන්වීම් - අනුමැතීන් යටතේ ක්‍රියාත්මක වෙන අයුරින් ප්‍රතිපාදන සකසා ඒ සමාගමෙන් මෙම ආයෝජන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට කෙරෙන යෝජනාව පිළිගත නො හැකි බව,

(ආ) එම සමාගමේ ක්‍රියාන්විත තුළ ශ්‍රී ලංකාවේ අරමුණු හා අයිතීන් සුරැකෙන බව තහවුරු කිරීම එම සමාගමේ ඡන්ද බලය හිමි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් කීප දෙනා අත පමණක් රැඳවීම යෝග්‍ය නොවන බව, සහ

(ඇ) MCA-Sri Lanka වෙනුවට පවත්නා රාජ්‍ය ආයතනික ව්‍යුහයක් මෙම ප්‍රදානය ක්‍රියාවට නැංවීමේ මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස යොදා ගැනීමට MCC ආයතනය එකඟ නො වන්නේ නම් ජාතික අරමුණුවලට අගතිකාරී විය හැකි දේ සිදු නොවනු ඇතැයි විශ්වාසයෙන් තහවුරු කළ නො හැකි බව,

viii. ඒ බැවින්, MCC ගිවිසුම් යෝජනාවලිය පිළිබඳව සලකා බැලීමට නම්, මූලික වශයෙන් ;

(අ) මෙම යෝජනාවලියට අදාළ ප්‍රදාන යොමු කිරීම සඳහා මෙතෙක් අප රට තුළ විධිමත් ව ක්‍රියාත්මක වූ විදේශ ආධාර කළමනාකරණ ක්‍රමවේදය යොදා ගනු ලැබිය යුතු බව,

(ආ) විශේෂ වශයෙන්, මීට අදාළ ප්‍රදාන අරමුදල් රාජ්‍ය භාණ්ඩාගාරය ඔස්සේ කළමනාකරණය විය යුතු බව,

(ඇ) අදාළ ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ දැනටමත් ස්ථාපිත රාජ්‍ය ආයතනික ව්‍යුහයක් තුළින් මෙහෙයවනු ලැබිය යුතු බව,

(ඈ) විදේශ රටවල නීති හෝ රෙගුලාසි හෝ ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ බලාත්මක කෙරෙන නෛතික ස්ථාපනයන් නො කළ යුතු බව,

(ඉ) ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට හා ජාතික ආර්ථික ස්වයංපෝෂිතත්වයට හානි කර විය හැකි කිසිදු කොන්දේසියක් හෝ වගන්තියක් යෝජනාවලිය තුළ නොතිබෙන වග තහවුරු විය යුතු බව,

(ඊ) ආයෝජනයට යෝජිත ව්‍යාපෘති අතර ජාතික වශයෙන් හා සමාජ-ආර්ථික වශයෙන් අවදානම් සහගත අංග ද තිබෙන බැවින් යෝජනාවලිය, හා ව්‍යාපෘති නැවත සැකසිය යුතු බව, සහ

(උ) මේ සම්බන්ධයෙන් මතභේදයට ලක් වී ඇති ඉඩම් පිළිබඳ වැඩසටහන් අංගය සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බව, හෝ යම් හෙයකින් එ සේ කළ නොහැකි නම්, අවම වශයෙන් රජයේ ඉඩම්වලට සින්නක්කර ඔප්පු ප්‍රදානය වැනි ඉඩම් සමුච්චයකරණය, කැබලිකරණය හෝ විදේශකරණය වැනි අවදානම්කාරී ප්‍රතිඵලවලට තුඩු දිය හැකි ප්‍රතිපත්තීන්, ව්‍යාපෘතීන් හා පියවරයන් එම වැඩසටහන් අංගයෙන් ඉවත් කරමින් සහ සංවේදී මිනුම් දත්ත රජයේ බුද්ධිමය දේපොළක් පමණක් වීම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි වන අයුරින්, මිනුම්කරණයට හා ඩිජිටල්කරණයට පමණක් සීමා කළ යුතු බව.

<u>ඉහත 5(viii) හි නිර්දේශිත අයුරු ව්‍යාපෘති යෝජනාවලට හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන්ට අදාළ ගිවිසුම් කොන්දේසි සංශෝධනය කළ යුතු බවත්, එසේ කිරීමට MCC ආයතනය එකඟ නොවන්නේ නම් ගිවිසුම ප්‍රතික්ෂේප කළ යුතු බවත් කමිටුවේ මතයයි.</u>

තව ද, MCC යෝජනාවලිය සහ එහි ඇතුළත් ගිවිසුම් කෙටුම්පත් සමූහය සම්බන්ධ කිසිදු නිල තොරතුරක් 2019 ඔක්තෝබර් 29 දින එය අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා තෙක් පොදු මහජනතාවට පරිශීලනය කිරීමට හෝ අධ්‍යයනය කිරීමට විවෘත කර නොතිබුණු බවත්, සංයුක්ත ගිවිසුමේ කෙටුම්පත හැර අනෙකුත් කිසිදු ගිවිසුම් කෙටුම්පතක් හෝ ලියවිල්ලක් මේ වන තුරු මහජනතාවට විවෘත කර නොමැති බවත්, කමිටුවේ අවධානයට යොමු වෙයි. මෙ සේ මෙම ගිවිසුම් කෙටුම්පත් මහජනතාවගේ අවධානයෙන් ඈත් කර තැබෙන්නේ එම කෙටුම්පත්වල පැහැදිලිව ම දක්වා ඇති පරිදි එහි මුඛ්‍ය පරමාර්ථයක් වන ගිවිසුමේ ප්‍රතිපාදනයන් ශ්‍රී ලංකාවේ නීතියක් බවට පරිවර්තනය කර ගැනීමේ අභිලාෂය එකී ක්‍රියාව මඟින් මහජනතාවගෙන් සැඟැවෙන නිසා විය හැකි බව ද කමිටුවට නිරීක්ෂණය වෙයි.

තව ද, වර්තමාන භූ දේශපාලන-ආර්ථික සන්දර්භය තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල් ජාත්‍යන්තර බල කඳවුරුවල ගොදුරු බවට පත් වන්නේ සහ ඒ රටවල ජනතාව හා අනාගත පරම්පරාවන් අන්තර්ජාතිකව ණය කරුවන් හා වහලුන් බවට පත් කෙරෙන්නේ සෘජු යටත්විජිතකරණය ඔස්සේ නොව ප්‍රධාන වශයෙන් ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික අන්තර්ජාතික ගිවිසුම් හරහා ය. එබැවින්, තමන් හා තම අනාගත පරම්පරාවන් වෙනුවෙන් රජයයන් විසින් අත්සන් කෙරෙන ගිවිසුම්වල කොන්දේසි පිළිබඳව පූර්ව වශයෙන් දැනුවත්වීමට ඒ රටවල මහජනතාවට පරම අයිතියක් ඇත.

එ බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව අනුල්ලංඝනීය වන ජනතා පරමාධිපත්‍යය හා අන්‍යකරණය කළ නො හැකි ජාතික ස්වෛරීත්වය හිමි පොදු මහජනතාවගෙන් මෙ වැනි යෝජනා හා කෙටුම්පත් වසන් කර තැබීම නුසුදුසු බව ද, කමිටුව අවධාරණය කරයි.

මේ වසන් කර තැබීම සඳහා දැනට අවකාශ සපයා ඇති තොරතුරු දැන ගැනීමේ පනත වහාම සංශෝධනය කර එ වැනි ඉඩකඩ ඇහිරිය යුතු බව කමිටුව යෝජනා කරයි. එ සේ ම, ජාත්‍යන්තර ගිවිසුම් යෝජනා කෙටුම්පත් කිරීමේ දී, අධ්‍යයනය කිරීමේ දී හා අනුමත කිරීමේ

දී අනිවාර්යයෙන් අනුගමනය කළ යුතු වන්නා වූ විනිවිද පෙනෙන ක්‍රමවේදයක් නීතිගත කළ යුතු බව ද, පාර්ලිමේන්තුවේ සුදුසු බහුතරයකින් සම්මත වන්නා වූ තාක් ජාතිය නෛතික බැඳීමකට යටත් කෙරෙන්නා වූ කිසිදු අන්තර්ජාතික ගිවිසුමකට අත්සන් කිරීමට රජයකට නො හැකි පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය බව ද, කමිටුව නිර්දේශ කරයි.